*සැ. යු.* - 2014.09.05 වැනි දින පළ වූ අංක 1,879 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,880 - 2014 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාදා - 2014.09.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 212 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | — |


*සැ. යු.* - අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත 2014 අගෝස්තු මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ඔක්තෝබර් මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 සැප්තැම්බර් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


211 - B 80873 - 300 (2014/09)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, අතපත්තු මුදියන්සේලෑ කෝරාලලාගේ චමිලා කුමාරි අතපත්තු වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.02.10 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/ගලේ/6400 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන 295, තලකිරියාගම දඹුල්ල පදිංචි ඉහළ ගෙදර ටිකිරි බණ්ඩා වෙත ප්‍රදානය කොට, මාතලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ත 305/321/91 යටතේ, 1991.03.08 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2014.10.27 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දපල්ල කෝරළේ, තලකිරියාගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තලකිරියාගම නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් තිස් අටක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම,

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 294 (කමත); |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 45 ; |
| *දකුණට* | : | කැබලි අංක 296; |
| *බස්නාහිරට* | : | කැබලි අංක 43. |

ඒ. එම්. කේ. සී. කේ. අතපත්තු,
ප්‍රාදේශීය ලේකම්,
ගලේවෙල.

2014 ජූනි මස 11 වැනි දින.

09-215/1

---

## ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, කළහේ පාඩි කෝරාලගේ ලංකා ප්‍රියානි මධුවන්ති වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.04.20 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතලේ/ප්‍ර/440 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මාතලේ කොටුවේගෙදර ඒ ජනපදය අංක 22 හි පදිංචි එච්.මුතුබණ්ඩා මහතා වෙත ප්‍රදානය කොට, මාතලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 334 යටතේ, 1982.10.01 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2014.10.27 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොහොන්සිය පත්තුවේ කොටුවේගෙදර දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොටුවේගෙදර වත්ත නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, මාතලේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක ඒ. අයි. 20/4, 5 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක පී. පී. ඒ. 2411 දරන කට්ටි කැඩීමේ පිඹුරේ සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක 75 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් රූඩ් 01, පර්චස් 29 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම්

පී. පී. ඒ. 2411 පිඹුරේ කැබලි අංක 75 ට අනුරූපව,

| | | |
|---|---|---|
| *උතුරට* | : | පාර සහ කැබලි අංක 16 ; |
| *නැගෙනහිරට* | : | පාර ; |
| *දකුණට* | : | පාර සහ කැබලි අංක 21 ; |
| *බස්නාහිරට* | : | කැබලි අංක 21 සහ කැබලි අංක 17. |

කේ. පී. කේ. එල්. පී. මධුවන්ති,
ප්‍රාදේශීය ලේකම්,
මාතලේ.

2014 ජූනි මස 11 වැනි දින.

09-215/2

---

## ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

උතුරු මැද පළාත් සභාවේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, කුලතුංග මුදියන්සේලාගේ රේණු ලක්මාල් ජයතිලක වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.01.13 වැනි දින ප්‍රදානය කර ඇති අංක පො/ප්‍ර/632 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගල් අමුණ, කිරිමැටිය, අංක 577 ලිපිනයේ පදිංචි හපුතන්ත්‍රිගේ මිත්‍රපාල ගුණසේකර වෙත ප්‍රදානය කොට, පොළොන්නරුව

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 06/632 යටතේ, 1982.02.19 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2014.10.27 වැනි දිනට පෙර මාවෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ සිංහල පත්තුවේ 71 - C වෙහෙරගල ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසයේ ගල්අමුණ නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාර්වරයා භාරයේ ඇති අංක අ. ජ. පි. පො. 126 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි (අතිරේක අංක 01) අංක ජී 17/5, ජී 12/61 පිඹුරෙහි අංක 153 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 0 රූඩ් 03 පර්. 36ක් වූ කිරිමැටිය යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ගොඩ ඉඩම් කට්ටිය.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 132 ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 152 2/2 ; |
| *දකුණට* | : | කැබලි අංක 178 ; |
| *බස්නාහිරට* | : | කැබලි අංක 154. |

කේ. එම්. ආර්. එල්. ජයතිලක,
ප්‍රාදේශීය ලේකම්,
ලංකාපුර.

2013 ඔක්තෝබර් මස 24 වැනි දින.

09-216

---

### ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, එච්. එම්. එම්. යූ. බී. හේරත් වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1991.01.15 වැනි දින ප්‍රදානය කර ඇති අංක නු/කොත්/හර/ප්‍ර/ගො/162 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන නාවලපිටිය, හරංගලගම, හරංගල පදිංචි කලිගු ආරච්චිලාගේ හීන්අප්පු වෙත ප්‍රදානය කොට, නුවරඑළිය දිස්ත්‍රික්කයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කොත් 17/198/91 යටතේ, 1991.06.19 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2014.10.27 වැනි දිනට පෙර මාවෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිස්පනේ කෝරළේ 461/හරංගල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හරංගල, උඩගම්මැද්ද නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, නුවරඑළිය මැනුම් අධිකාරී භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක 61/18/3, 4 61/23/1, 2 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි මු. පි. නු. 907 දරන අංක 21 දරන බිම් කැබැල්ල වශයෙන් ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.225 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම-

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 18 (මාර්ග රක්ෂිතය) ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 22 ; |
| *දකුණට* | : | කැබලි අංක 22 ; |
| *බස්නාහිරට* | : | කැබලි අංක 20. |

එච්. එම්. එම්. යූ. බී. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
කොත්මලේ.

2013 අප්‍රේල් මස 10 වැනි දින.

09-217

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.